දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය / எனது இல. / My No. PSC/APL/1/Com. Decisions

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024.05.20

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත**

**<u>විනය නියෝගයන්ට එරෙහිව ඉදිරිපත් කරන අභියාචනා සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කිරීම</u>**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඔබ වෙත අභිනියෝජනය කර ඇති විනය බලතල අනුව, ඔබ විසින් නිකුත් කරන විනය නියෝගවලට එරෙහිව අදාළ නිලධාරීන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කරනු ලබයි.

02. එම අභියාචනාවලට අදාළව ඔබ වෙතින් කැඳවන 3 පරිශිෂ්ට ප්‍රකාර වාර්තාව සහ අදාළ ලිපි ලේඛන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමේ දී සිදු වන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා, අදාළ අභියාචනය ඔබ වෙත ලැබී මාස 02ක් ඇතුලත, විධිමත් විනය පරීක්ෂණ වාර්තාව සහ අදාළ ලිපි ගොනු, පරිශිෂ්ට වාර්තාව සමඟ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන මෙන් එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වා සිටිමි.

03. ඒ අනුව ඉදිරියේ දී ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් ඉහත රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝගය පරිදි කටයුතු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

Ndayo

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව